සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - I

නම/විභාග අංකය :-- ........................................................................................ කාලය : පැය 01යි.

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.
- 1 - 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (✖) ලකුණ යොදන්න.

(1) ''ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයයි.'' මෙසේ ප්‍රකාශ කළේ,

(1) ජී. එච්. කෝල් (2) ඒබ්‍රහම් ලින්කන් (3) සීලර් (4) ඇරිස්ටෝටල්

(2) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ දී සෘජුවම ජනතාවගේ අදහස් විමසන අවස්ථාවක් වන්නේ,

(1) ජනාධිපතිවරණය (2) පාර්ලිමේන්තු මැතිවරණය
(3) ජනමත විචාරණය (4) පළාත් සභා මැතිවරණය

(3) බලය බෙදා හැරීමක් සහිත ව ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රමය හඳුන්වනු ලබන්නේ,

(1) සන්ධීය ආණ්ඩුක්‍රමය (2) විධායක ආණ්ඩු ක්‍රමය
(3) බල ආණ්ඩු ක්‍රමය (4) රාජාණ්ඩු ක්‍රමය

(4) පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයක් වන්නේ,

(1) නීති සම්පාදනය (2) බලතල බෙදා හැරීම
(3) මහජන උපයෝගිතා සැපයීම (4) රටේ ආරක්ෂාව තහවුරු කිරීම

(5) පහත සඳහන් රටවල් කාණ්ඩ අතරින් ඒකීය ආණ්ඩු ක්‍රමය පමණක් ක්‍රියාත්මක වන රටවල් කාණ්ඩය වන්නේ,

(1) මහා බ්‍රිතාන්‍යය, ශ්‍රී ලංකාව, ප්‍රංශය (2) ශ්‍රී ලංකාව, ඇමරිකා එක්සත් ජනපදය, බංග්ලාදේශය
(3) ස්විට්සර්ලන්තය, ඕස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව (4) කියුබාව, ඕස්ට්‍රේලියාව, මහා බ්‍රිතාන්‍යය

(6) ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක ගණනක් අයත් පළාත වන්නේ,

(1) උතුරු පළාත (2) නැගෙනහිර පළාත (3) මධ්‍යම පළාත (4) දකුණු පළාත

(7) පළාත් සභාවක අමාත්‍ය මණ්ඩලය සකස් වී ඇත්තේ,

(1) මහ ඇමති හැර ඇමතිවරු පස් දෙනෙකුගෙනි (2) මහ ඇමති සහ ඇමතිවරු තිදෙනෙකුගෙනි. (3) මහ ඇමති සහ ඇමතිවරු හතර දෙනෙකුගෙනි. (4) මහ ඇමති හැර ඇමතිවර හතර දෙනෙකුගෙනි.

(8) බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ ශ්‍රී ලංකාවේ මහ නගර සභා පිහිටුවීමට අදාළ ආඥා පනත වන්නේ,

(1) 1943 පළාත් සභා ආඥා පනත (2) 1871 ගම්සභා ආඥා පනත
(3) 1981 ප්‍රාදේශීය මණ්ඩල අඥා පනත (4) 1947 මහ නගර සභා ආඥා පනත

(9) පළාත් සභාවක බලතල වර්ගීකරණය යටතේ ලැයිස්තු I, II හා III ට අයත් බලතල හා කාර්යයන් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර වන්නේ,

(1) 37, 17, 36 (2) 17, 36, 37 (3) 16, 37, 36 (4) 37, 36, 17

(10) ඉතා සංකීර්ණ බහු සංස්කෘතික ලක්ෂණ ඇති රටක් වන්නේ,

(1) ශ්‍රී ලංකාව (2) ඇමරිකා එක්සත් ජනපදය
(3) කියුබාව (4) මාලදිවයින

(11) මූලික ආර්ථික ප්‍රශ්න මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් විසඳනු ලබන අර්ථ ක්‍රමය වන්නේ,

(1) මිශ්‍ර අර්ථ ක්‍රමය (2) ධනවාදී අර්ථ ක්‍රමය
(3) සමූපාකාර අර්ථ ක්‍රමය (4) සමාජවාදී අර්ථ ක්‍රමය

- **12 - 13 ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම සඳහා පහත දැක්වෙන තීරු උපයෝගී කර ගන්න.**

| I | | II | |
|---|---|---|---|
| 1. | වෙළඳාම | A | දකුණු ඉන්දියානුවන් |
| 2. | අධ්‍යාපන හා රැකියා | B | බටහිර ජාතීන් |
| 3. | වෙළඳ භෝග වගාව | C | චීන ජාතිකයන් |
| 4. | කුළු බඩු හා ක්‍රිස්තු භක්තිකයන් | D | විවිධ ජාතීන් |

(12) ඉහත I තීරුවේ සාධක II තීරුවේ ජාතීන් හා ගැළපීමේ දී නිවැරදි පිළිතුර වන්නේ,

(1) C D A B (2) D A C B (3) A B C D (4) D B C A

(13) මෙම ජාතීන් අතුරින් සංක්‍රමණික කණ්ඩායමක් වන්නේ

(1) A (2) B (3) C (4) D

(14) පහත සඳහන් පිළිතුරු අතරින් අන්තර් භාණ්ඩ පමණක් අයත් පිළිතුර වන්නේ,

(1) පොහොර, ඛනිජතෙල්, ආහාර (2) වාහන, දැව, යන්ත්‍රසූත්‍ර
(3) ඛනිජ තෙල්, දැව, පොහොර (4) දැව, ඖෂධ, යන්ත්‍ර සූත්‍ර

(15) වෙළඳපොළ ආර්ථිකයක් පිළිබඳ විග්‍රහයේ දී නොගැළපෙන වගන්තිය වන්නේ,

(1) වෙළඳපොළ ආර්ථිකයන්හි වැඩි වශයෙන් ධනවාදී ලක්ෂණ සහිත රටවල් ඇත.
(2) වෙළඳපොළ ආර්ථිකයක සමාජවාදී ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබන රටවල් ද ඇත.
(3) වෙළඳපොළ ආර්ථිකය නව ලිබරල්වාදී ආර්ථිකය ලෙස හැඳින්වේ.
(4) වෙළඳපොළ ආර්ථිකයක රජයේ උපරිම මැදිහත් වීමක් ඇත.

(16) වර්තමානයේ සිදුවන සංවර්ධන ක්‍රියා නිසා ශ්‍රී ලංකාවට අත්වන වාසියක් නොවන්නේ,

(1) සේවා නියුක්තිය ඉහළ යාම (2) යටිතල පහසුකම් වර්ධනය වීම
(3) ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම (4) විදේශීය මැදිහත්වීම් බහුල වීම

(17) සංවර්ධනය පිළිබඳ ව එක්සත් ජාතීන්ගේ සංවිධානය 2000 වසරේ දී සම්මත කරගත් ''සහශ්‍රක සංවර්ධන ඉලක්ක'' ගණන වන්නේ,

(1) අටකි (2) පහකි (3) දහයකි (4) දොළහකි

(18) නූතන රාජ්‍යයන්ට ඉටු කර ගැනීමට ඇති අවශ්‍යතාවයක් නොවන්නේ,

(1) ජාතික එකමුතුවක් පවත්වාගෙන යාම (2) එක් ජාතියකට වැඩිපුර වරප්‍රසාද දීම
(3) ජාතික ආරක්ෂාව සහතික වීම (4) සාමය පවත්වා ගැනීම

(19) ගැටුමක් නිර්මාණය වීමට බලපාන මනෝ විද්‍යාත්මක සාධකය වන්නේ,

(1) ආකල්පය (2) ප්‍රචණ්ඩත්වය (3) බිය (4) සංතාපය

(20) ''ජය - ජය'' විසඳුම් ලබාදෙන ගැටුම් නිරාකරණය කිරීමේ පහසුම ක්‍රමය වන්නේ,

(1) විනිසීම (2) කේවල් කිරීම (3) සාකච්ඡා ක්‍රමය (4) මැදිහත්කරණය

(21) මූලික අයිතිවාසිකම් සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,

(1) මානව අයිතිවාසිකම් අතුරින් තෝරාගත් ප්‍රධානත ම අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් වේ.

(2) සෑම මූලික අයිතිවාසිකමක් ම මානව අයිතිවාසිකමක් නොවේ.

(3) මූලික අයිතිවාසිකම් කඩ වූ විට නීතියේ පිළිසරණක් ලබා ගත හැක.

(4) මානව අයිතිවාසිකම් හිමි වන්නේ තෝරා ගත් පිරිසකට පමණි

(22) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමට පදනම් වූ මූලධර්මයක් නොවන්නේ,

(1) ළමයාගේ උපරිම යහපත (2) වෙනස් කොට සැලකීම

(3) පැවැත්ම සහ සංවර්ධනය (4) සහභාගිත්වය

(23) 1939 දී සම්මත කරන ලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්මුතියේ දෙවන වෛකල්පිත සම්මුතියේ අරමුණ වන්නේ,

(1) මරණ දඬුවම අහෝසි කිරීම

(2) දේශපාලන අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම.

(3) සිවිල් අයිතිවාසිකම් සුරැකීම

(4) කඩ වූ මානව හිමිකමක් වෙනුවෙන් නීතිමය පියවර ගැනීම

(24) ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමේ වයස් කාණ්ඩය වන්නේ,

(1) අවුරුදු 55 - 60 (2) අවුරුදු 55 - 57 (3) අවුරුදු 57 - 60 (4) අවුරුදු 60 - 63

(25) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන නීතිය වන්නේ,

(1) වනජීවී සංරක්ෂණ පනත (2) වනභූමි පනත

(3) ජාතික පාරිසරික පනත (4) භූ විද්‍යා සංරක්ෂණ පනත

(26) මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ සීමා ඇති බවට නිර්වචනය ඉදිරිපත් කළේ,

(1) මහාචාර්ය ගානර් (2) හැරල්ඩ් ලැස්කි (3) ඒබ්‍රහම් ලින්කන් (4) හොවාඩ් ගාඩ්නර්

(27) වර්තමාන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වනුයේ,

(1) උඩරට නීතිය (2) මුස්ලිම් නීතිය (3) රෝම ලන්දේසි නීතිය (4) රාජ නීතිය

(28) පාර්ලිමේන්තු පනත් මගින් දක්වා ඇති වැරදි සම්බන්ධ ව ක්‍රියා කිරීමේ බලය අයත් අධිකරණය වන්නේ,

(1) මහේස්ත්‍රාත් අධිකරණය (2) මහාධිකරණය (3) දිසා අධිකරණය (4) උපරිමාධිකරණය

(29) අප්‍රමාදීව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීමේ වැදගත්කමට අදාළ නොවන කරුණක් වන්නේ,

(1) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට පැමිණීම (2) අධිකරණයේ ගෞරවය සුරැකීම

(3) රට තුළ දූෂණය හා වංචාව තුරන් වීම (4) සාධාරණත්වය හා සමානාත්මතාව වැඩි දියුණු වීම

(30) 1994න් පසු ශ්‍රී ලාංකික පුරවැසියෙකුට සිය පැමිණිල්ල ඍජුව ම ඉදිරිපත් කළ හැකි පුද්ගලයා වන්නේ,

(1) නීතිපතිවරයා (2) ඔම්බුඩ්ස්මන්වරයා

(3) රජයේ නීතිඥවරයා (4) මහේස්ත්‍රාත්වරයා

(31) ශ්‍රී ලංකාවේ උත්තරීතර නීතිය වන්නේ,
(1) සාමාන්‍ය නීතිය (2) අපරාධ නීතිය
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය (4) සිවිල් නීතිය

(32) ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක වන්නේ,
(1) රත්නපුර, කෑගල්ල (2) කුරුණෑගල, පුත්තලම
(3) බදුල්ල, මොනරාගල (4) අනුරාධපුර - පොළොන්නරුව

(33) ශ්‍රී ලංකාවේ ගම පාලනය ගම් සභාවකින් සිදු වූ බව ....................................................... ගේ වාර්තාවල සඳහන් වේ.
(1) මහාචාර්ය ගානර් (2) හැරල්ඩ් ලැස්කි (3) ලෙනාඩ් වුල්ෆ් (4) රොබට් නොක්ස්

(34) ප්‍රාදේශීය ඒකකවල බලය විමධ්‍යගත කිරීමට බලපෑමක් නොකළ හේතුවක් වන්නේ,
(1) ජනතා අවශ්‍යතා පහසුවෙන් ඉටු කිරීම (2) ජනතාවට වඩා සමීප පාලන ඒකක පිහිටුවීම
(3) මධ්‍යම ආණ්ඩුව යටතේ බලතල ඒකරාශී කර ගැනීම (4) ප්‍රාදේශීය නායකත්වයට ඉඩ ප්‍රස්ථා ලබා දීම.

● **පහත I තීරුවේ දැක්වෙන ආයතන හා II තීරුවේ කාර්යයන් උපයෝගී කරගෙන 35 - 36 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| I | | II | |
|---|---|---|---|
| 1. | විධායකය | A | නීති විවරණය |
| 2. | ව්‍යවස්ථාදායකය | B | රාජ්‍ය ආරක්ෂක කාර්ය |
| 3. | අධිකරණය | C | විධායකය පාලනය |
| | | D | අයවැය පාලනය |

(35) I තීරුවේ ආයතන හා II තීරුවේ කාර්යයන් නිවැරදිව ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,
(1) A C D B (2) B C D A (3) B D A C (4) A B D C

(36) ඉහත දැක්වෙන එක් ආයතනයක් මගින් සිදුවන කාර්යයන් 2ක් දක්වා ඇත. එම ආයතනය වන්නේ,
(1) ව්‍යවස්ථාදායකය (2) විධායකය (3) අධිකරණය (4) කිව නොහැක

(37) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පාර්ලිමේන්තුවේ නිල කාලය වන්නේ,
(1) වසර පහකි (2) වසර හයකි (3) වසර හතරකි (4) වසර තුනකි

(38) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන දැක්වෙන පිළිතුර වන්නේ,
(1) නගර සභා, ගම් සභා, ප්‍රාදේශීය සභා (2) නගර සභා, ප්‍රාදේශීය සභා, ගම් සභා
(3) මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා (4) පළාත් සභා, නගර සභා, ප්‍රාදේශීය සභා

(39) බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංවිධානය වන්නේ,
(1) යුරෝපා (2) බිම්ස්ටෙක් (3) සීඩෝ (4) සප්තා

(40) ගෝලීයකරණය තුළ ලෝකයම තනි ආර්ථිකයක් බවට පත්විය යුතු බවට යෝජනා ඉදිරිපත් කළ සංවිධානය වන්නේ,
(1) එක්සත් ජාතීන්ගේ සංවිධානය (2) යුරෝපා සංගමය
(3) ආසියානු සංවිධානය (4) ලෝක වෙළඳ සංවිධානය

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - II

**නම/විභාග අංකය :-- ................................................................................** **කාලය : පැය 2 යි.**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20යි. තෝරාගත් අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමි වේ.

01. (1) ආණ්ඩු ක්‍රමවල ස්වරූප දෙක සඳහන් කරන්න.
(2) දුරාතීතයේ පාලන පහසුව සඳහා මෙරට බලය විමධ්‍යගත කර තිබූ බවට උදාහරණ අවස්ථා 2ක් දෙන්න.
(3) ඇමරිකා එක්සත් ජනපදයේ හා ස්විට්සර්ලන්තයේ ප්‍රාන්ත රාජ්‍ය ගණන පිළිවෙළින් ලියා දක්වන්න.
(4) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් දෙදෙනෙක් නම් කරන්න.
(5) පුද්ගල වුවමනාවන්ගේ ලක්ෂණ දෙකක් ලියන්න.
(6) ප්‍රාග්ධන භාණ්ඩ දෙකක් නම් කරන්න.
(7) ගැටුම් මඟහැර මනසේ සාමය ඇති කිරීමට යොමු විය හැකි ක්‍රියාකාරකම් දෙකක් ලියන්න.
(8) ශ්‍රී ලංකාවේ පවතින නීති වර්ග දෙකක් ලියන්න.
(9) ළමා අයිතිවාසිකම් දෙකක් සඳහන් කරන්න.
(10) අයිතිවාසිකම් හා බැඳුනු පුරවැසි යුතුකම් දෙක නම් කරන්න. (ල.2 x 10 = 20)

02. (1) පුරාතනයේ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ තිබූ බවට සඳහන් වන පෙරදිග හා අපරදිග රටවල් දෙකක් නම් කරන්න.
(2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී වර්තමානයේ මතු ව ඇති ගැටලු තුනක් සඳහන් කරන්න.
(3) නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න.

03. (1) ජන සමාජයේ සියලු බලවේග මෙහෙය වන සංස්කෘතියට අයත් ලක්ෂණ දෙකක් නම් කරන්න.
(2) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ තුනක් ලියන්න.
(3) බහු සංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත් ව ජීවත් වීමෙන් අයත් වන ප්‍රයෝජන තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

04. (1) ආර්ථිකයක නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.
(2) මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ක්‍රම තුන සඳහන් කරන්න.
(3) තිරසාර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

05. (1) ශ්‍රී ලංකාවේ අධිකරණ හා නීතිමය කටයුතු පිළිබඳ ඉහළ ම නීති නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න.
(2) මානව හිමිකම් කොමිසම සතු බලතල තුනක් ලියන්න.
(3) අප්‍රමාදීව අපක්ෂපාතී ව යුක්තිය පසිඳලීමේ වැදගත්කම පිළිබඳ කරුණු තුනක් ලියා ඉන් එකක් විස්තර කරන්න.

06. (1) මහ නගර සභාවක හා නගර සභාවක ප්‍රධාන නිලධාරීන් දෙදෙනා නම් කරන්න.

(2) ඔබ තෝරා ගත් එක් නිලධාරියෙකු සතු බලතල තුනක් ලියන්න.

(3) ආණ්ඩුකාරවරයා සතු බලතල තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න.

07. (1) මානව අයිතිවාසිකම් වර්ග දෙකක් නම් කරන්න.

(2) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී අවධානය යොමු කළ කරුණු තුනක් ලියන්න.

(3) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන තුනක් දක්වා, පරිසරය හා බැඳුණු යුතුකම් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## පුරවැසි අධ්‍යාපනය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | (2) | 11. | (4) | 21. | (4) | 31. | (3) |
| 2. | (3) | 12. | (1) | 22. | (2) | 32. | (3) |
| 3. | (1) | 13. | (4) | 23. | (1) | 33. | (4) |
| 4. | (3) | 14. | (3) | 24. | (1) | 34. | (3) |
| 5. | (1) | 15. | (4) | 25. | (3) | 35. | (2) |
| 6. | (1) | 16. | (4) | 26. | (2) | 36. | (1) |
| 7. | (3) | 17. | (1) | 27. | (3) | 37. | (2) |
| 8. | (4) | 18. | (2) | 28. | (1) | 38. | (3) |
| 9. | (1) | 19. | (1) | 29. | (1) | 39. | (2) |
| 10. | (2) | 20. | (3) | 30. | (2) | 40. | (2) |

(2 × 20 = ලකුණු 40)

### II පත්‍රය

01. (1) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය, ජනාධිපති ආණ්ඩු ක්‍රමය

(2) (i) අනුරාධපුර යුගයේ රජරට රුහුණු රට, මලය රට දක්ෂිණ දේශය ලෙස පාලන ඒකක බෙදා තිබීම.

(ii) පොළොන්නරු යුගයේ දී පාලන කොටස් 4කට බෙදීම (11 ශ්‍රේණිය පෙළ පොත 25 පිටුව)

(3) ඇමරිකා එක්සත් ජනපදය 50

ස්විට්සර්ලන්තය 26

(4) ටී. බී. ටයිලර්, ඊ. ටී. හිලර්, චාර්ල්ස් එල්වුඩ්

(5) වුවමනා විවිධ වීම, අසීමිත වීම

(6) යානවාහන, යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි ආදිය

(7) ආගමික වතාවත්වලට යොමු වීම, උපදේශනය, ආදී ගැළපෙන පිළිතුරු

(8) උඩරට නීතිය, මුස්ලිම් නීතිය, තේසවලාමේ නීතිය

(9) අධ්‍යාපන, ප්‍රකාශන නිදහස, ආරක්ෂා වීම ආදී... පෙළපොත 65 පිටුව

(10)නීතිමය යුතුකම්, සදාචාරාත්මක යුතුකම්

02. (1) පෙරදිග - ඉන්දියාව, අපරදිග - ග්‍රීසිය

(2) භූමි ප්‍රමාණය විශාල වීම, ජනගහනය අධික වීම අවශ්‍යතා සංකීර්ණ වීම.

(3) නියමිත කාලය තුළ මැතිවරණ පැවැත්වීම. මැතිවරණ නීතිවලට අනුකූල වීම/සුදුසුකම් සහිත පුරවැසියන් ට ඡන්දය ලබා දීමට/ ලබා ගැනීමට අයිතිය ....(10 පෙළ පොත 10 පිටුව) විස්තරය අනුව ලකුණු දෙන්න.

03. (1) ආගම, භාෂාව, ඇදහිලි (10 පෙළ පොත 58 පිටුව)

(2) විවිධ ජනවර්ග/විවිධ සංස්කෘතික ලක්ෂණ/විවිධ භාෂා කතා කරන පිරිස් සිටීම/විවිධ ආගම් අදහන පිරිස් එකට සිටීම.

(3) ජාතික සමගිය සහජීවනය වර්ධනය වේ/ගැටුම් අවම වේ./මිනිස් නිදහස තහවුරු වේ... (10 පෙළ පොත 67 පිටුව) විස්තරය අනුව ලකුණු දෙන්න.

04. (1) ප්‍රාග්ධන සූක්ෂ්ම/ශ්‍රම සූක්ෂ්ම

(2) ධනවාදී/සමාජවාදී /මිශ්‍ර අර්ථ ක්‍රම

(3) මූලික අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම, පරිසරය ආරක්ෂා කර ගැනීම / සමාජ සුරක්ෂිතතාවය

(ගැළපෙන විස්තරයට ලකුණු දෙන්න)

05. (1) අධිකරණ ඇමති, නීතිපති, අග්‍රවිනිශ්චයකාර

(2) මානව හිමිකම් ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම

මානව හිමිකම් උල්ලංඝණය වීම විමර්ශනය කිරීම

මානව හිමිකම් පිළිබඳ පළාත් මට්ටමේ උප කමිටු පිහිටු වීම

(3) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම වැළැකේ / අධිකරණය කෙරෙහි විශ්වාසය තහවුරු වේ/අගතියට පත් පුදුගලයන්ට අසාධාරණයක් සිදු නොවේ / රට තුළ අපරාධ අවම වේ. (ගැළපෙන විස්තරයට ලකුණු දෙන්න)

06. (1) මහ නගර සභාව - නගරාධිපති /නගර සභාව - සභාපති

(2) අදාළ පළාත් පාලන ආයතනයේ විධායක නිලධාරියා වීම සභාව කැඳවීම.

කල් තැබීම / මුලසුන ගැනීම (10 පොත 52 පිටුව)

(3) පළාත් සභාව කැඳවීම / විසුරුවා හැරීම / සභාව ඇමතීම / සංදේශ යැවීම / පළාත් සභා ප්‍රඥප්ති අනුමත කිරීම.

07. (1) සිවිල් අයිතිවාසිකම්/දේශපාලන/ආර්ථික/සමාජයීය අයිතිවාසිකම්

(2) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගිත්වය

(3) පරිසර අමාත්‍යාංශය/වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව/වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගැළපෙන විස්තරයට ලකුණු දෙන්න. (11 පෙළ පොත - 72 පිටුව)